
# වර්ණවත් ඉනිමක සදාතනික මතකය







ශ්‍රී ලාංකේය ක්‍රීඩාලෝලී හදවත් මත වර්ණවත් මතක කදම්බයක් ඉතිරි කරමින් බන්දුල වර්ණපුර නම් අද්විතීය මිනිසා ඉකුත් ඔක්තෝබර් 18 වැනිදා පෙරවරුවේ 68 වසරක් වූ සිය දිවි ඉනිම අවසන් කළේ කොළඹ පෞද්ගලික රෝහලක ප්‍රතිකාර ලබමින් සිටියදීය. සුවහසක් සෝ සුසුම්, බුහුමන් මැද 19 වැනිදා සවස කොළඹ බොරැල්ල ආදාහනාගාරයේදී ඔහු දැයෙන් සමුගත්තේය.

බන්දුල වර්ණපුර සහ ක්‍රිකට් යනු දෙකක් නොව එකක් වන තරමට ඔහු මෙරට ක්‍රිකට් ලෝලීන්ට සමීප වූ ස්වර්ණමය යුගයක් තිබිණි. ජීවිතයෙන් සමුගන්නා තුරුම වරින් වර ඒ මතක අවදි කරන්නට සමත් වූ බන්දුල වර්ණපුර ශ්‍රී ලංකේය ක්‍රිකට් ඉතිහාසයට එක්වන්නේ මෙරට පළමු ටෙස්ට් ක්‍රිකට් නායකයා ලෙසිනි. 1981 වසරේ ජූලි 21 වැනිදා ශ්‍රී ලංකාවට ටෙස්ට් වරම් හිමිවීමෙන් පසු 1982 වසරේ පෙබරවාරි 17 වැනිදා සරවනමුත්තු ක්‍රීඩාංගණයේදි (ඕවල් ක්‍රීඩාංගණය) ශ්‍රී ලංකා පිල සහ සංචාරක එංගලන්ත කණ්ඩායම අතර පැවති පළමු ටෙස්ට් තරගයේදී කාසියේ වාසිය දිනාගෙන පළමුව පන්දුවට මුහුණ දුන් බන්දුල වර්ණපුර, ශ්‍රී ලංකාව වෙනුවෙන් පළමු ටෙස්ට් ලකුණ රැස් කරමින් මෙරට ක්‍රිකට් ඉතිහාසයේ නව පරිච්ඡේදයක් සනිටුහන් කළේය.

ප්‍රතාපවත් ක්‍රීඩකයකු, ක්‍රිකට් පුහුණුකරුවකු, විශිෂ්ට විස්තර විචාරකයකු, තරග විනිසුරුවරයකු සහ දක්ෂ පරිපාලකයකු ආදී භූමිකා රැසකට පණ දුන් ඔහු ඒ සියල්ල පරයමින් සහෘදයන් අතර ප්‍රකටව සිටියේ ඍජුව කතා කරන, තීන්දු තීරණ ගන්නා එඩිතර හදවතක් සහිත අභීත මිනිසකු ලෙසටය.

ප්‍රතාපවත් ක්‍රීඩකයකු, ක්‍රිකට් පුහුණුකරුවකු, විශිෂ්ට විස්තර විචාරකයකු, තරග විනිසුරුවරයකු සහ දක්ෂ පරිපාලකයකු ආදී භූමිකා රැසකට පණ දුන් ඔහු ඒ සියල්ල පරයමින් සහෘදයන් අතර ප්‍රකටව සිටියේ ඍජුව කතා කරන, තීන්දු තීරණ ගන්නා එඩිතර හදවතක් සහිත අභීත මිනිසකු ලෙසටය. ඔහුගේ හදිසි නික්ම යෑම පිළිබඳ පසුගිය දිනවල ලියැවුණු, කියැවුණු බොහෝ දෑ අතර ජනමාධ්‍ය අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මුහුණු පොතට එක්කළ සටහනකින් බන්දුල වර්ණපුර ට බුහුමන් පළකර තිබුණේ 'වර්ණවත් ඉනිමට ආචාරය' ලෙසිනි.

බන්දුල වර්ණපුරගේ ජීවිත ඉනිම ආරම්භ වූයේ 1953 වසරේ මාර්තු 1 වැනිදා රඹුක්කනදී ය. විශේෂඥ වෛද්‍යවරයකු වූ ඔහුගේ පියා ජාතික රෝහලේ ප්‍රකටව සිටියේ ඩොක්ටර් ප්‍රනාන්දු නමිනි. බන්දුලගේ සොහොයුරන් වූ සරත් සහ උපාලි ආනන්ද විද්‍යාලයේ ක්‍රිකට් කණ්ඩායමට ක්‍රීඩා කළ අතර ඔවුන් භාවිත කළේ ප්‍රනාන්දු යන පෙළපත් නාමය වුවද බන්දුල භාවිත කළේ වාසගමේ කොටසක් වූ වර්ණපුර නම ය. බන්දුල වර්ණපුර නාලන්දා විද්‍යාලයෙන් ක්‍රිකට් ජීවිතය ආරම්භ කරද්දී 1964-1969 කාලයේ එම විද්‍යාලයේ විදුහල්පතිව සිටි ගුණපාල වික්‍රමරත්නයන් ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීම සඳහා විශේෂ උනන්දුවක් දැක්වීය. එවකට සීගිරිය පාසලක උගන්වමින් සිටි උපාධිධාරී ක්‍රීඩා ගුරුවරයකු වූ ප්‍රේමසර ඈපාසිංහ 1968 වසරේදී නාලන්දා විද්‍යාලයේ ක්‍රිකට් භාර ආචාර්යවරයා ලෙස පත්කර ගැනීමට ගුණපාල වික්‍රමරත්න කටයුතු කළේ නාලන්දය ක්‍රිකට් ක්‍රීඩාවෙන් ඉහළ නැංවීමේ අරමුණිනි. තමාගේ දක්ෂ සිසුවකු වූ බන්දුල වර්ණපුරගේ හදිසි වියෝවෙන් කම්පාවට පත්ව සිටින ප්‍රවීණ ක්‍රිකට් විස්තර විචාරක ප්‍රේමසර ඈපාසිංහ ඒ මතක ආවර්ජනය කළේ සංවේගයෙනි.



"මම නාලන්දේ ක්‍රීඩා භාර ගුරුවරයා විදිහට වැඩ කරද්දි බන්දුල වර්ණපුර අවුරුදු 14න් පහළ ක්‍රිකට් කණ්ඩායමට ක්‍රීඩා කළා. 1957 දී මමත් නාලන්දා විද්‍යාලයේ ආරම්භක පිතිකරුවෙක් විදිහට ක්‍රීඩා කළා. බන්දුලයි මායි අතර අපූරු සමානකමක් තිබුණා. 1947- 1982 දක්වා කාලයේ නාලන්දා විද්‍යාලයේ ක්‍රිකට් පුහුණුකරු විදිහට හිටියේ ජෙරී ගුණරත්න මහත්මයා තමයි මට ක්‍රිකට් ඉගැන්නුවේ. ඒ වගේම බන්දුලට මුලින්ම ක්‍රිකට් ඉගැන්වුවේත් එතුමා. බන්දුලගේ දක්ෂකම් දුටුවාම ලංකාවේ පළමු වැනි ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩකයා මගේ පාසලෙන්, නාලන්ද විද්‍යාලයෙන් ම බිහිකරන්න මගේ හිතේ ලොකු බලාපොරොත්තුවක් ඇතිවුණා. අබුසුවාඩ් කියන්නේ ඒ කාලේ තේරීම් කමිටුවල සභාපතිත්වය දැරූ මගේ සමකාලීන ක්‍රිකට් ක්‍රීඩකයෙක් වගේම මගෙ සමීපතම මිතුරෙක්. මම ඔහුට කිව්වාලු අබූ මට කොහොම හරි බන්දුල ලංකාවේ පළමුවැනි ටෙස්ට් කැප්ටන් කරලා දෙන්න කියලා. ඒකට ගැළපෙන දක්ෂකම් බන්දුල ළඟ අඩුවක් නැතිව තිබුණා. මගේ බලාපොරොත්තුව ඉටු කරමින් ලංකාවේ පළමු වැනි ටෙස්ට් නායකයා ලෙස බන්දුල පියවරෙන් පියවර ඉහළට යද්දි මම ඔහු ගැන ගොඩක් ආඩම්බර වුණා."

ප්‍රේමසර ඈපාසිංහයන් ඒ අතීත මතක අතර ඇවිදින්නේ දොම්නසිනි. දොම්නස, බන්දුල වර්ණපුර නමැති තමාගේ ප්‍රිය ශිෂ්‍යයා මේ තරම් කලින් දිවි ඉනිම අවසන් කිරීමය.

1971 වසරේ නාලන්ද විද්‍යාලයේ ක්‍රිකට් කණ්ඩායමේ නායකත්වයට පත්වූ බන්දුල වර්ණපුර 1972 වසරේ දක්ෂතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා බවට පත්විය. 1975 වසරේදී පළමු එක්දින ලෝක කුසලාන තරගාවලිය නියෝජනය කළ ශ්‍රී ලංකා කණ්ඩායමට ඇතුළත් වීමේ භාග්‍යය ද ඔහුට හිමි විය. ඒ, 1975 වසරේ ජූනි 7 වැනිදා එංගලන්තයේ මැන්චෙස්ටර් නුවර පැවැති බටහිර ඉන්දීය කොදෙව් පිලට එරෙහි තරගය සඳහා සහභාගි වෙමිනි. 1979 වසරේදී එක්දින ලෝක කුසලාන තරගාවලියේ ඉන්දියාව සමඟ පැවැති තරගයේදී නායක අනුර තෙන්නකෝන් ආබාධයකට ලක්වීම නිසා බන්දුල වර්ණපුරට ශ්‍රී ලංකා පිලේ නායකත්වය දැරීමට අවස්ථාව සැලසිණි. එය මේ දක්ෂ, ජවසම්පන්න තරුණයාගේ බඹරය වැල්ලේ කැරකුණු අවස්ථාවක් බවට පත්වූයේ ලංකාවට ඓතිහාසික ජයක් හිමිකර දෙමිනි. එවකට ටෙස්ට් වරම් නොලැබූ රටක් විසින් ටෙස්ට් කණ්ඩායමක් පරාජයට පත් කරනු ලැබූ පළමු අවස්ථාව ලෙස එය අන්තර්ජාතික ක්‍රිකට් වාර්තා පොතට ද එක්විය.

ක්‍රිකට් ලෝක කුසලානය දිනාගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් පිල මෙහෙයවූ අසහාය නායක, හිටපු ටෙස්ට් ක්‍රිකට් නායක අර්ජුන රණතුංග බන්දුල වර්ණපුර ගේ ප්‍රතාපවත් නායකත්ව පෞරුෂය සිහි කළේ මෙලෙසිනි.

"බන්දුල අයියා මුලින්ම හමුවෙද්දි මම අවුරුදු 15න් පහළ ළාබාල ශිෂ්‍යයෙක්. ආනන්ද -නාලන්දා ක්‍රිකට් තරගවලදි බන්දුල අයියව මම දැක්කේ දැවැන්ත චරිතයක් විදිහට. බන්දුල අයියා එක්ක පළමුවැනි ටෙස්ට් තරගයට සහභාගී වෙද්දි ලැබූ අත්දැකීම් ක්‍රීඩකයෙක් විදිහට වගේම පසුකාලයේදී නායකයෙක් විදිහට වැඩ කරද්දිත් මට ගොඩක් ප්‍රයෝජනවත් වුණා. බන්දුල අයියා අපි වගේ තරුණ ක්‍රීඩකයන්ව හැම වෙලාවෙම ආරක්ෂා කළා. බන්දුල අයියගේ නායකත්වය යටතේ මට වැඩි කාලයක් ක්‍රීඩා කරන්න බැරිවුණත් මම ඔහුගෙන් බොහෝ දේවල් ඉගෙන ගත්තා. ක්‍රිකට් ක්‍රීඩාවෙන් ඉවත් වුණත් ක්‍රිකට් වෙනුවෙන් විශාල සේවයක් කළ ඔහුට ලංකාවේ ක්‍රිකට් ගැන විශාල ආදරයක්, හැඟීමක් තිබුණා. ක්‍රිකට් ගැන බය නැතුව කතාකරන්න, අඩුපාඩු වැරදි පෙන්නලා දෙන්න තරම් හයිය කොන්දක් තිබුණ බන්දුල අයියා නැතිවීම මගෙත් අතපය කඩලා දැම්මා වගේ පාඩුවක්."